**සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම -2018/2019**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශන  පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. එසේ වුවද, 2019 මාර්තු 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුමේ පැවති එකතුව රු. මිලියන 75 ක්වූ බැර ශේෂ එදිනට පැවති හර ශේෂවලටද වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගිණුමේ පැවති එකතුව රු.343,757 ක්වූ හර ශේෂ එදිනට පැවති බැර ශේෂවලටද හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, උපයන විට ගෙවීම් බදු, ආර්ථික සේවා ගාස්තු හා මුද්දර බදු වශයෙන් එකතුව රු.මිලියන 8 ක් වූ ගෙවිය යුතු බදු ශේෂයට ආදායම් බදු හා උපයන විට ගෙවීම් බදු හර ශේෂ හිලව් කර දක්වා තිබූ අතර රු.මිලියන 13 ක් වූ විලම්භිත බදු හර ශේෂය ජංගම නොවන වගකීම් යටතේ හිලව් කර දක්වා තිබුණි. | 2019/2020 මූල්‍ය ප්‍රකාශන වල සිට දැක්වීමට කටයුතු කර ඇත. | ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 66 ඡේදය ප්‍රකාරව, ජංගම වත්කම් යටතේ දැක්විය යුතු ලැබිය යුතු පොලී ආදායම ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2019/2020 මූල්‍ය වාර්තාවේ සිට ලැබිය යුතු පොලී ආදායම සහ කෙටිකාලීන තැන්පතු වටිනාකම වෙන වෙනම දැක්වීමට කටයුතු කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 106 (ඇ) ඡේදය ප්‍රකාරව, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශයෙහි වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇතුළත් ආයුගණක ලාභය සහ විදේශ විනිමය ලාභය වෙන වෙනම හෙළිදරවු කළ යුතු වුවද ඉන් බැහැරව රු.මිලියන 354 ක් වූ මුළු විස්තීර්ණ ආදායමම ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය තුල දක්වා තිබුණි. | 2019/2020 මූල්‍ය වාර්තාවේ සිට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල ආයු ගණක, ලාභය සහ විදේශ විනිමයේ ලාභය වෙන වෙනම හෙළිදරව් කිරිමට කටයුතු යොදා ඇත. | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14 සහ 20 ඡේද ප්‍රකාරව, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය අස්තිත්වයේ ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය කිරීම සඳහා ඇතුළත් වන ගනුදෙනු හා අනෙකුත් සිද්ධීන්හි ප්‍රතිඵලයක් වන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හෙළිකරන ලද ආදායම් වියදම් සහ තොගවල හා මෙහෙයුම් සම්බන්ධ ලැබිය යුතු හා ගෙවිය යුතු අගයන්ගේ කාලපරිච්ඡේදයේ වූ වෙනස්වීම පෙන්නුම් කිරීමෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වෙනත් විස්තීර්ණ ආදායම තුළ ඇතුළත් වන රු. මිලියන 7 ක්වූ ආයුගණක ලාභය සහ රු. මිලියන 217 ක්වූ විදේශ විනිමය ලාභය බදු පෙර ලාභය සඳහා ගැලපීම් කර තිබුණි. | 2019/2020 සිට මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ බදු පෙර ලාභය සඳහා ගැලපීම් කිරීමේ දී විනිමය ලාභය සහ ආයු ගණන ලාභය නොගැනීමට කටයුතු සිදුකර ඇත. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.මිලියන 13 ක්වූ මෝටර් රථ සහ පිරිවැය රු.මිලියන 39 ක්වූ බොඩි ආමර් හා බැලස්ටික් හෙල්මට් සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 (ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2019/2020 මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර ඇත. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 739 ක් වැයකළ පසුව ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණු ගොඩනැගිල්ල පිහිටි පර්චස් 86.4 ක් පමණවූ ඉඩමෙහි වටිනාකම තක්සේරු කර අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019/2020 මූල්‍ය වාර්තාවලදී එම වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතුකර ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය කළ යුතු වීම. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | | |
| මෝටර් වාහන | 26 | 29 | 3 | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම ඊට අනුරූපී උපයෝගී ලේඛන සමග සමාන විය යුතු වීම. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | --------- | ------- | ---------------------- | ------------------------- | ----------------- |
| | | රු.මිලියන | | | |
| (අ) | වාර්ෂික ක්ෂය වියදම | 10 | ස්ථාවර වත්කම් අත්පත් කරගත් දිනයන් හා ක්ෂයවීම් සම්බන්ධ විස්තර සහිත ලේඛන/ උපලේඛන | 2019/2020 මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර ඇත. | ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සහ ස්ථාවර වත්කම් | 2,366 | ශේෂ සනාථ කිරීම් හා භෞතික තොග සත්‍යාපන වාර්තා | භෞතික තොග සත්‍යාපන වාර්තා හා ශේෂ සනාථ කිරීම් ඇතුළත් කිරීමට කටයුතු කෙරේ. | භෞතික තොග සත්‍යාපන වාර්තා හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ) | වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ | 762 | ශේෂ සනාථ කිරීම් | සමාගමට ගෙවීමට ඇති මුදල සනාථකර නොමැත. | ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඈ) | බොඩි ආමර් හා බැලැස්ටික් හෙල්මට් | 9 | පැවති තොග ඌණතාවයන් සම්බන්ධයෙන් ඉල්ලා ඇති තොරතුරු | පත්කර ඇති මණ්ඩලයේ නිගමන හා නිර්දේශ අනුව අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | -එම- |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 මාර්තු 31 දිනට පැවති රු. මිලියන 2,299 ක්වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයෙන් රු. මිලියන 1,651ක් සමුද්‍රීය ආරක්ෂණ සේවා සැපයීමෙන් ලැබිය යුතු ණය ශේෂය විය. ඉන් රු. 1,525 ක් එනම් මුළු ණය සියයට 92.4 ක් ඇවන්ගාඩ් ආයතනයෙන් ලැබිය යුතු ණය ශේෂය විය. රංගල හා ගාල්ල පාවෙන අවි ගබඩා තුළින් ලැබිය යුතු පිළිවෙලින් රු.මිලියන 84 ක් හා රු.මිලියන 378 ක්වූ ශේෂ වර්ෂ 07 කට අධික කාලයක සිට අයනොවී තිබූ අතර එම ණය අයකරගැනීමටද කටයුතු කර නොතිබුණි. | වන්දි මුදලක් අයකර ගැනීමට අපේක්ෂාකර ඇති බැවින් මුදල් ගෙවීමට කටයුතු කර ඇති අතර රංගල හා ගාල්ල පාවෙන අවි ගබඩා මඟින් ලැබිය යුතු මුදල් 2021/2022 මූල්‍ය ප්‍රකාශන වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ණය ශේෂයන්හි කාල විශ්ලේෂණය අනුව ආයතන 08 කින් වසර 05 ට වැඩි කාලයක සිට ලැබිය යුතු ණය ශේෂය රු.මිලියන 711 ක්වූ අතර මාස 06 ට අඩු ලැබිය යුතු ණය ශේෂ වටිනාකම රු.මිලියන 54 ක් විය. දිගුකාලීනව නිරවුල් නොවූ ණය ශේෂ අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකර සමාගම විසින් එම ආයතන සමඟ අඛණ්ඩව කටයුතු කර තිබුණි. | 2021 ගිණුම් වර්ෂයේ දී කපා හැරීමට අවශ්‍ය අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | -එම- |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය | සමාගමේ ශේෂ පත්‍ර දිනයෙන් පසුව මාස 06 ක් ඇතුළත හෝ රෙජිස්ටාර්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි දීර්ඝ කරන ලද යම් කාලයක් ඇතුලත, මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කර ඇති බවටත් මූල්‍ය ප්‍රකාශන වගකිවයුතු පුද්ගලයෙකු විසින් එය පනතේ නියමයන්ට අනුකූලව වන බව සහතික කර ඇති බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකු විසින් දින යොදා අත්සන් කර ඇති බවටත් අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් අත්සන් කර තිබුණේ 2021 දෙසැම්බර් 08 දීය. | අදහස් දැක්වීම් ඉදිරිපත් කර නැත. | පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ චක්‍රලේඛය | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 5.1 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ii) | 6.5.1 ඡේදය | සමාගම විසින් ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත හා පිටපත් අදාල අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 08 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. එදිනට ප්‍රමාද කාලය වර්ෂ 02 මාස 06 ක් වී තිබුණි. | -එම- | -එම- |
| (iii) | 6.5.3 ඡේදය | 2017, 2018 හා 2019 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (iv) | 7.4.1 ඡේදය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් අවම වශයෙන් පැවැත්විය යුතු වුවත් රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි. | -එම- | -එම- |
| (v) | 7.4.5 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා 2019 මාර්තු 31 දිනට වූ ස්ථාවර වත්කම් සත්‍යාපනය | 2020 වර්ෂයේ සිට මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර යාවත්කාලීන කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල ක්‍රියාවලිය සිදු කිරීම පියවරෙන් පියවර ආරම්භ කිරීමට ක්‍රියා කර ඇත. | |
| (vi) | 8.2.2 ඡේදය | (i) වසර කිහිපයක සිට පැවත එන මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කර ඇති රු. මිලියන 1,161 ක්වූ කෙටිකාලීන තැන්පතු ගිණුම් කාල පරිච්ඡේදයේදී නැවත ආයෝජනය කිරීම් සිදුකර තිබුණු අතර එම නැවත ආයෝජනය කිරීමට අදාළව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | රජයට අයත් බැංකු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත. | -එම- |
| | | (ii) සමාගමේ කටයුතු හේතුවෙන් ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 3.1 ක් තැන්පතු ලෙස අයෝජනය කිරීමට අදාළ ලිඛිත සාක්ෂි හා සමාලෝචිත වර්ෂය තුළදී එක්සත් ජනපද ඩොලර් මිලියන 2.1 ක් නැවත ආයෝජනය කිරීමට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (vii) | 9.3 ඡේදය | සමාගම සංස්ථාපනය කළ දින සිට මේ දක්වා සේවක මණ්ඩලය සඳහා බඳවා | 2021 වර්ෂයේ සිට මානව සම්පත් කළමනාකරණයට | -එම- |

| | | |
|---|---|---|
| | ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් (පාලන උපදෙස්) සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කරවා ගෙන නොතිබුණි. | අයත් සියලු කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකිරීමට අවස්ථාව ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.129,489,498 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 22,259,368 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.107,230,130 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම සියයට 481 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බැංකු ගාස්තු පිළිවෙලින් රු.1,575,912 ක් හා රු.4,269,077 ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 170 කින් වැඩිවී තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් හා වෙනත් කාර්යාල වියදම් පිළිවෙලින් රු.1,220,467 ක් හා රු.5,503,891 ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 350 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රක්නා ලංකා ආරක්ෂක සමාගමේ ප්‍රධානතම ආදායම් මාර්ගය දේශීය හා සමුද්‍රීය ආරක්ෂක සේවා සැපයීම මත තීරණය වුවද එම ආදායම් නිසි පරිදි ඉන්වොයිස් කර අදාල ආයතන වෙත යවා, එම ආයතන සමඟ ඇතිවන වෙනස්කම් හඳුනාගෙන එය විධිමත්ව කළමනාකරණයට හා පාලනයට සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපිත කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | 2021/2022 මූල්‍ය වර්ෂයේ සිට ණය අයකර ගැනීමට වෙනම අංශයක් පිහිටුවා ඒ හරහා අවශ්‍ය කටයුතු සිදු කෙරේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------------- | ---------------------------- | ------------------------ |
| (අ) | සමාගම සහ සී/ස අවන්ගාර්ඩ් මැරිටයිම් සර්විස් පුද්ගලික සමාගම අතර පැවති ව්‍යාපාර ගිවිසුම 2019 ජනවාරි 24 දිනෙන් අවසන් වී ඇති නමුත්, 2020 සැප්තැම්බර් මාසය වන විටත් ඇවන්ගාර්ඩ් සමාගම වෙත භාරදී තිබුණු ස්වයංක්‍රීය හා අර්ධ ස්වයංක්‍රීය ගිනි අවි 103 ක් සහ පතොරම් 28,789 ක් නැවත සමාගම වෙත ලබාගෙන නොතිබුණි. | ඉදිරියේ දි එම අවි නැවත ලබා ගැනීමට ක්‍රියා මාර්ග ගනු ලැබේ. | වත්කම් නැවත ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | නෞකා සමාගම් වෙත 2011 වර්ෂයේදී නිකුත් කර ඇතත්, මෙතෙක් ආපසු භාරදී නොමැති, ගිනි අවි 13 ක් අස්ථාන ගතවී තිබූ අතර පිළිවෙලින් ස්වයංක්‍රීය හා අර්ධ ස්වයංක්‍රීය ගිනි අවි 04 ක් හා 03 ක්ද ඊට ඇතුළත්ව තිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු ඇතුලත්ව මණ්ඩලයක් පත්කර ඒ සබැදිව කරුණු සොයා බැලීමට කටයුතු සිදුකර ඇති අතර එම මණ්ඩල විසින් නිගමන හා නිර්දේශ ඉදිරිපත් කල පසු ඉදිරි ක්‍රියා මාර්ග ගැනිමට නියමිතව ඇත. | -එම- |